අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල-2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1. 1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

රජයේ බැංකුවක තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතු වෙනුවෙන් 2012 ජනවාරි 06 සිට 2013 ජනවාරි 17 දක්වා කාලසීමාව සඳහා ලැබී තිබුණු පොලිය රු.1,116,894 ක් විය. මෙයින් 2013 ජනවාරි 01 සිට 2013 ජනවාරි 17 දින දක්වා කාලසීමාවට අදාළ වූ රු.59,140 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට බැරකර තිබීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම රු.59,140 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.2.2 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

භාර ඔප්පුවේ 18 වන වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් සෑම මාස 02 කට වරක් භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතුවලින් ප්‍රතිඵලය රු. 10,586,879 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 11,252,107 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු. 665,228 ක සුළු වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ වියදම රු. 11,541,986 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම,ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 රු. | 2011 රු. | රු. |
| කළුතර මහාධිකරණ කලාපය | - | - | 299,872 |
| හම්බන්තොට / මාතර මහාධිකරණ කලාපය | 1,636,205 | 1,121,183 | 3,354,010 |
| හලාවත / පුත්තලම මහාධිකරණ කලාපය | - | 1,788,758 | 2,623,768 |
| අධිකරණ ප්‍රවර්ධන භාර අරමුදලේ කාර්යාලය | - | - | 209,081 |
| කොළඹ මහාධිකරණ කලාපය | 2,828,298 | 2,671,632 | 7,723,207 |
| කුරුණෑගල මහාධිකරණ කලාපය | 1,180,988 | 504,530 | 1,829,955 |
| කෑගල්ල මහාධිකරණ කලාපය | - | 1,974,383 | 2,392,492 |
| ගාල්ල මහාධිකරණ කලාපය | - | - | 63,697 |
| අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය | - | - | 372,598 |
| අනුරාධපුර මහාධිකරණ කලාපය | - | 760,000 | 760,000 |
| ගම්පහ මහාධිකරණ කලාපය | 5,896,495 | 2,889,205 | 8,785,700 |
| එකතුව | 11,541,986 | 11,709,691 | 28,414,380 |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

අරමුදලේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ සංයුක්ත සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂයේ සිදු කළ යුතු කාර්යයන් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

**4.2** අයවැය ලේඛනය

2012 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**4.3** අභ්‍යන්තර විගණනය

අරමුදලේ ගණුදෙනු අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම